**සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය - 2018**

**------------------------------------------------**

සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර, 2016 දෙසැම්බර් 28 දින එළඹි අංක 5915-එල් කේ දරණ ණය ගිවිසුමේ II බී (3) පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ද මුදල් අමාත්‍යාංශය වේ. ශ්‍රී ලංකාව තුළ දුප්පත් සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ප්‍රයෝජනය සඳහා සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල සමානාත්මතාව, කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා දායකවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය, එක්සත් ජනපද ඩොලර් මිලියන 75 කට සමාන රුපියල් මිලියන 11,212 ක් වී තිබුණු අතර, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයම ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර, එය 2022 මාර්තු 30 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

## 1.3 මතය

මාගේ මතය අනුව මේ සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන් තුළින්, 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු කෙරෙන අතර, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කර ඇත.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද :

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1. ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරියක් ගොඩනැඟීම, ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධති සැකසීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ සැලසුම් කිරීම යන සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සිදු කෙරේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය සම්බන්ධව පහත නිරීක්ෂණයන් සිදුකෙරේ.

| | සංරචකය | ක්‍රියාකාරකම | විගණන ගැටළුව | බලපෑම | අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම. | සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම. | සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා තිබුණද එය අපේක්ෂා කල පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | අපේක්ෂිත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබෙනු ඇත. | ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් බඳවා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් සුහ සාධක ප්‍රතිලාභ මණ්ඩලය ක්‍රියාත්මක කරවීමට නොහැකි වී තිබුණි. | වගකිවයුතු පාර්ශවයන් දැනුවත් කිරීමට සහ සුදුසුකම් සහිත පුද්ගලයන් මණ්ඩලයට බඳවා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරය | ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාර යක් ගොඩනැඟීම. | වර්තමානයේ සිටින සහ මේ දක්වා සිටි ප්‍රතිලාභීන්ගේ දත්ත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය මෙතෙක් ස්ථාපිත කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිම කිරීමේදී ප්‍රමාදයන් ඇතිවිය හැකිය. | සමාජ ලේඛනාධිකාරී තොරතුරු පද්ධතිය ගොඩ නැඟීම සඳහා පද්ධති සැකසුම් කරුවකු ප්‍රසම්පාදනය කිරීමේදී ප්‍රමාදයන් සිදු වීම. | ප්‍රතිශෝධිත සුහසාධක ක්‍රමයේ මූලික හරය ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාර යක් ස්ථාපිත කිරීම වන බැවින් ඒ සඳහා කඩිනම් පියවර ගත යුතු වේ. |
| (ඇ) | ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතිය | ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම. | සමාලෝචිත වර්ෂය තුලදී සුහ සාධක ප්‍රතිලාභී යෝජනා ක්‍රම සකස් කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණ අතර, සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ දත්ත සම්බන්ධ තොරතුරු සමාජලේඛනාධිකාරියේ තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. ව්‍යාපෘති ඇගයීමේ ලේඛනයට අනුව අවම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් සියයට 10 ක ප්‍රතිශතයකට හෝ මෙම කළමනාකරණ තොරතුරු පද්ධතියට ප්‍රවේශ වීමේ පහසුකම් ලබා දීම සිදු කෙරෙනු ඇතැයි අපේක්ෂා කරන ලද නමුත් සමාලෝචිත වර්ෂය තුලදී එවැනි | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිම කිරීමේදී ප්‍රමාදයන් ඇතිවිය හැකිය. | මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණු අතර, අදාල තොරතුරු රැස් කිරීම සඳහා වූ මූලික කටයුතු ආරම්භ කර තිබුණි. | පද්ධති සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ඒජන්සිය හරහා පද්ධති සැකසුම්කරු වෙත බලපෑම් කිරීම අවශ්‍ය වේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි. | | | |
| (ඇ) | ඒකාබද්ධ සේවා සැපයුම් පද්ධතිය | රේඛීය අමාත්‍යාංශය තුල ව්‍යාපෘති තාක්ෂණික ඒකකයක් පිහිටුවීම. | යෝජිත ව්‍යාපෘති තාක්ෂණික ඒකකය පිහිටුවීම සඳහා ව්‍යාපෘතිය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රමාද වනු ඇත. | නියමිත පරිදි පැහැදිලි කිරීම් සිදු කර නැත. | සැලසුම් කර තිබුණු පරිදි මෙම ක්‍රියාකාරකම ස්ථාපිත කිරීමට පියවර ගත යුතු වේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| **විගණන ගැටළුව** | **බලපෑම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| උපයෝජන සම්බන්ධතා දර්ශක ප්‍රගතිය තහවුරු කර ගැනීම සඳහා ස්වාධීන තුන්වන පාර්ශවයක් පත් කර නොතිබුණි. | තෙවන පාර්ශවය මගින් සිදු කරනු ලබන සහතික කිරීමකින් තොරව ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ණය වාරික නිකුත් නොකරනු ඇත. | සමාජ ලේඛනාධිකාරී තොරතුරු පද්ධතිය ප්‍රමාද වීම හේතුවෙන් මෙම කාර්යයද ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතට අනුව ස්වාධීන තෙවන පාර්ශවයක් පත් කිරීමට පියවර ගත යුතු වේ. |